# බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ
# ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථාන අතර පවත්වන තරගාවලිය 2024
# තරඟ සඳහා අයඳුම් කිරීමේ සුදුසුකම් හා පොදු කොන්දේසි
# "ග්‍රාම අභිමන්"

01. මෙම තරගාවලිය පාසල් අංශය හා විවෘත අංශය ලෙස අංශ දෙකකින් පැවැත්වේ.

02. පාසල් අංශයේ තරග සඳහා බස්නාහිර පළාතේ පදිංචි, දැනට පාසල් අධ්‍යාපනය ලබන ඕනෑම දරුවෙකුට ඉදිරිපත් විය හැකි අතර එම අංශයේ සියළුම තරග, කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වශයෙන් අංශ දෙකකින් යුක්ත වේ.

03. විවෘත අංශය සඳහා වයස අවුරුදු 50 ට අඩු සහ 50 ට වැඩි වශයෙන් බාණ්ඩ දෙකක් යටතේ පැවැත්වෙන අතර ඉදිරිපත් වන සෑම තරඟකරුවෙක්ම තරඟකාරියක්ම බස්නාහිර පළාතේ ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිතියක සාමාජිකයෙකු හෝ හෝ ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථානයක පාඨමාලා හදාරන පුහුණුලාභියෙකු විය යුතුයි.

04. පාසල් වා විවෘත අංශය වෙනුවෙන් ඉදිරිපත් විය හැකි තරග අංශ පහත පරිදි වේ.

| තරග අංශය | පාසල් අංශය | | විවෘත අංශය | |
|---|---|---|---|---|
| | කණිෂ්ඨ | ජ්‍යෙෂ්ඨ | 50 ට අඩු | 50 ට වැඩි |
| • සාම්ප්‍රදායික නර්තන - ඒකල | | | √ | √ |
| • සාම්ප්‍රදායික නර්තන - සමූහ | | | √ | √ |
| • නව නිර්මාණ - ඒකල | | | √ | √ |
| • නව නිර්මාණ - සමූහ | | | √ | √ |
| • ජන ගායනා - ඒකල | √ | √ | √ | √ |
| • සරල ගීත ගායනා - ඒකල | √ | √ | √ | √ |
| • සමූහ ගායනා | √ | √ | √ | √ |
| • නිවේදන | √ | √ | √ | √ |
| • චිත්‍ර | √ | √ | √ | √ |
| • ගද්‍ය රචනා | √ | √ | √ | √ |
| • පද්‍ය රචනා - සදැස් | √ | √ | √ | √ |
| • පද්‍ය රචනා - නිසදැස් | √ | √ | √ | √ |

05. තරඟ ඉසව් සඳහා ඉදිරිපත්වන සියළුම තරඟකරුවන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය අතර ජාතික හැඳුනුම්පත නොමැති පාසල් දරුවන්ගේ තැපැල් හැඳුනුම්පත තිබේනම් ඒම හැඳුනුම්පත හා උප්පැන්න සහතිකයේ පිටපතක් රැගෙන ආ යුතුය.

06. තරඟ සඳහා අයදුම්පත්‍රය සම්පූර්ණ කර ග්‍රාම සංවර්ධන නිලධාරිගේ / මැහුම් උපදේශිකාවගේ සහතිකය සමග පහත සඳහන් ලිපිනයට, අයදුම් පත් කැඳවා ඇති අවසන් දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුයි.

07. ඒක් තරගකරුවෙක් හෝ තරගකාරියක් සඳහා ඒකල තරග ඉසව් 05 සඳහා පමණක් ඉදිරිපත් විය හැකි අතර සමූහ තරග සඳහා උපරිම සීමාවක් නොමැත.

08. **ඒකල තරග සඳහා ඉදිරිපත් වන තරගකරුවන් ඇමුණුම 01** යටතේ දක්වා ඇති අයදුම්පත්‍රයද, **සමූහ තරග සඳහා ඉදිරිපත් වන තරගකරුවන් ඇමුණුම 02** යටතේ දක්වා ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතුයි. ( සමූහ තරග අයදුම්ත ඉදිරිපත් කලයුතු වන්නේ ග්‍රාම සංවර්ධන සමිතිය / ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානය යටතේය.)

09. චිත්‍ර තරගය, ගද්‍ය රචනා හා පද්‍ය රචනා තරගය සඳහා සහභාගි වන අයදුම්කරුවන් විසින් අදාල තරග ශීර්ෂය යටතේ දක්වා ඇති උපදෙස් පරිදි අදාල නිර්මාණ ඒවිය යුතු අතර ඉන් තෝරාගන්නා තරගකරුවන් අවසන් වටයක් සඳහා කැඳවීම් කරනු ලබන දිනකදි තරගයට ඉදිරිපත් විය යුතු අතර **පාසල් අයදුම්කරුවෙකු නම් තම චිත්‍රය, ගද්‍ය රචනාව හෝ පද්‍ය රචනාව අයදුම්කරුගේම නිර්මාණයක් බවට පාසලේ විදුහල්පතිගේ හෝ දහම් පාසලක ප්‍රධානාචාර්ය විසින් සහතික කර එවිය යුතුයි**.

10. චිත්‍ර, පද්‍ය හා ගද්‍ය රචනා එවීමේදී එම නිර්මාණය සමඟ **ඇමුණුම අංක 01** සඳහන් අයදුම්පත්‍රයද අමුණා එවිය යුතුයි.

11. තරඟකරුවන්ගේ වයස් සීමාව 2024.12.31 දිනට ගණනය කරනු ලැබේ.

- කණිෂ්ඨ අංශය - වයස අවුරුදු 15 ට අඩු
- ජ්‍යෙෂ්ඨ අංශය - වයස අවුරුදු 15 ට වැඩි 20 ට අඩු
- විවෘත අංශය - වයස අවුරුදු 50 ට අඩු / 5 ට වැඩි

12. මෙම සියළු තරග සඳහා මා විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩල මගින් ගනු ලබන තීරණ අවසාන තීරණය වන බව කරුණාවෙන් සලකන්න. නියමිත වේලාව ඉක්මවීම, හෝ වෙනත් ඕනෑම තරඟ කොන්දේසියක් උල්ලංඝනය කිරීම ලකුණු කපා හැරීමට හෝ තරඟ හෝ තරඟාවලියෙන් ඉවත් කිරීමට හෝ හේතු සාධක වන බව සැලකිය යුතුය.

13. කිසියම් තරඟ ඉසව්වක් පැවැත්වීමේදී චක්‍රලේඛ උල්ලංඝනය කිරීම් හා වෙනත් එවැනි විරෝධතාවයක් ඇත්නම් අදාල තරඟ ඉසව්ව පවත්වා පැය භාගයක කාලයක් ඇතුලත ඔබගේ අභියාචනා ඉදිරිපත් කල හැකි අතර අදාල තරඟ ඉසව්ව අවසාන වී පැය භාගයකින් පසුව ලබාදෙන විරෝධතා නිෂ්ප්‍රභා කරනු ලැබේ.

14. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024 සැප්තැම්බර් 30 දිනය වේ.

15. වැඩි විස්තර පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 011-2093624 හෝ 011-2093627 යන දුරකතන මගින් දැනගත හැකිය.

16. මෙම චක්‍රලේඛය හා අදාල අයදුම් පත්‍රය මෙම අමාත්‍යාංශයේ www.drd.wp.gov.lk දරන වෙබ් අඩවිය මගින් ලබාගත හැක.

17. අයදුම්පත්‍ර යොමු කිරීමේදී ලිපියෙහි වම් පස ඉහළ කෙළවරෙහි **<u>"ග්‍රාම අභිමන් 2024 "</u>** යන්න සඳහන් කළ යුතුය.

18. අයදුම්පත්‍ර යොමු කලයුතු ලිපිනය :

අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව (බ.ප.)
අංක: 204 ,පළාත්සභා ගොඩනැගිල්ල.
9 වන මහළ,
ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත
බත්තරමුල්ල.

# <u>අදාල තරඟ ඉසව්</u>

## ❖ නර්තන තරඟ

**(ග්‍රාම සංවර්ධන සමිතිවල සාමාජිකයන් හා ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුලාභීන් සඳහා පමණි)**

### 1) ශාස්ත්‍රීය නර්තනය

I. උඩරට, පහතරට, සබරගමු යන අංශ තුන යටතේ ඕනෑම අංශයකින් ඉදිරිපත් විය හැක. ( සම්ප්‍රදායන් මිශ්‍ර කර නිර්මාණය ඉදිරිපත් කල හැක)

II. ඒකල හා සමූහ (සමූහ තරග සඳහා වයස් සීමාවක් නැත) වශයෙන් තරග ඉසව් දෙකක් යටතේ පැවැත්වේ.

- ගායනය හා වාදනය සඳහා සජීවි හෝ කලින් සකසා ගත් සංගීත ඛාණ්ඩ (Music Trak) යොදාගත හැක.
- කාලය උපරිම විනාඩි 05 කි.
- සමුහ තරඟ සඳහා අවමය 05 සහ උපරිමය 12 ( ගැහැනු /පිරිමි දෙපාර්ශවටම සහභාගි විය හැක)

### 2) නව නිර්මාණ නර්තනය

i. ඕනෑම ශෛලියක නර්තනයක් ඉදිරිපත් කල හැක.

ii. ඒකල හා සමූහ (සමූහ තරග සඳහා වයස් සීමාවක් නැත) වශයෙන් තරග ඉසව් දෙකක් යටතේ පැවැත්වේ.

- ගායනය හා වාදනය සඳහා සජීවි හෝ කලින් සකසා ගත් සංගීත ඛාණ්ඩ (Music Trak) යොදාගත හැක.
- කාලය උපරිම විනාඩි 05 කි.
- සමුහ තරඟ සඳහා අවමය 05 සහ උපරිමය 12 ( ගැහැනු /පිරිමි දෙපාර්ශවටම සහභාගි විය හැක

## ❖ ගායනා තරඟ

### 01. ජන ගායන ඒකල

- විවිධ තාල ඇතුලත්ව ගායනාවන් 02 ඉදිරිපත් කල යුතුයි.
- වාදනය සඳහා අවශ්‍ය නම් ඕනෑම භාණ්ඩයක් යොදා ගත හැක.
- වයස අවුරුදු 50 ට අඩු සහ 50 ට වැඩි යන අංශ දෙකෙන්ම පැවැත්වේ

.

## 02. සමූහ ගායනා

**(ග්‍රාම සංවර්ධන සමිතිවල සාමාජිකයන් හා ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුලාභීන් සඳහා පමණි)**

- ඕනෑම වර්ගයක ගීත භාවිතා කලහැක.
- ඕනෑම වාද්‍ය භාණ්ඩයක් මේ සඳහා යොදා ගත හැකිය.
- ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 ක් වන අතර වාදක මණ්ඩලයත් සමඟ සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 15 කට නොවැඩි විය යුතුය.
- කාලය උපරිමය විනාඩි 05 කි.
- වයස් සීමාවක් නැත.

## 03. සරල ගී ගායනා ( ඒකල)

- ගායනා කළ හැක්කේ එක් ගීතයක් පමණි.
- ඕනෑම ශෛලියක (සිංහල) ගිතයක් යොදාගත හැක.
- මුල් නාද මාලාවට හානි නොවන පරිදි ගායනය ඉදිරිපත් කළ යුතුය.
- කලින් සකසා ගත් සංගිත ඛණ්ඩ **(Music Trak)** යොදාගත හැක.
- ගායනයට හානි නොවන පරිදි අංග චලන යොදා ගත්තාට වරදක් නැත.

## ❖ නිවේදන තරඟය

- තරග සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
- ප්‍රසාංගික නිවේදන තරග සඳහා තමන් කැමති සජීවී විස්තර කථනයක් සහ විනිශ්චය මණ්ඩලය ලබාදෙන නිවේදන අවස්ථාවක් ඉදිරිපත් කිරීම සිදුකල යුතුයි.

## ❖ චිත්‍ර තරඟය

- මූලික අදියර ලෙස 14”x 18”ප්‍රමාණයේ සන කඩදාසියක අතේ නොගෑවෙන තමන් කැමති මාධ්‍යයක් භාවිතා කරමින් චිත්‍ර නිර්මාණය ඉදිරිපත් කල යුතුය.
- මූලික වටය සඳහා **"අපේ ගමේ අසිරිය"** යන මාතෘකාව යටතේ ඔබගේ චිත්‍ර නිර්මාණය කර අයදුම් පත්‍රයද සමඟ අමුණා එවිය යුතුයි.
- ඔබ විසින් එවන ලද චිත්‍ර අතුරෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අවසන් තරඟාවලිය සඳහා චිත්‍ර සජීවීව චිත්‍ර සිතුවම් කල යුතු වේ.

## ❖ ගද්‍ය රචනා තරඟය

- තරග සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
- එක් තරඟකරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් රචනාවක් පමණි.
- මූලික වටය සඳහා **"ග්‍රාමීය සංවර්ධනය දේශීය ආර්ථිකය සඳහා දක්වන දායකත්වය"** යන තේමාව ඔස්සේ ඕනෑම මාතෘකාවක් යටතේ ඔබගේ රචනාව ඉදිරිපත් කල යුතු අතර ඔබ විසින් එවන ලද රචනා අතුරෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අවසන් තරගාවලිය සඳහා ඉදිරිපත් විය යුතුයි.
- පාසල් තරග කරුවන්ගේ රචනාව වචන 400 කින් සමන්විය යුතු අතර විවෘත අංශය තරගකරුවන් සඳහා රචනාවේ වචන ගණන 500 විය යුතුයි.
- සියළු නිර්මාණ ස්වතන්ත්‍ර වියයුතු අතර මොනම ආකාරයකින් හෝ වෙනත් නිර්මාණයකින් උපුටාගත් හෝ අනුවර්තනය කරගත් හෝ ඇසුරු කරගත් නිර්මාණයක් නොවිය යුතුය. එසේම මෙයට පෙර කිසිදු ආකාරයකින් හෝ ප්‍රකාශයට පත් වී නැති නිර්මාණයක් විය යුතුය

## ❖ පද්‍ය රචනා - සඳැස්

- ❖ තරග සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
- ❖ එක් තරඟකරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් සඳැසක් පමණි.
- ❖ මූලික වටය සඳහා **"සොඳුරු ලොව අපේ ගම"** යන මාතෘකාව යටතේ ඔබගේ සඳැස ඉදිරිපත් කල යුතු අතර ඔබ විසින් එවන ලද සඳැස අතුරෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අවසන් තරගාවලිය සඳහා ඉදිරිපත් විය යුතුයි.
- ❖ පාසල් තරඟකරුවන් හා විවෘත අංශයේ සියළු තරගකරුවන් සඳහා සඳැස් 5 ත් 7 ත් අතර ප්‍රමාණයක් විය යුතුය.
- ❖ සියළු නිර්මාණ ස්වතන්ත්‍ර වියයුතු අතර මොනම ආකාරයකින් හෝ වෙනත් නිර්මාණයකින් උපුටාගත් හෝ අනුවර්තනය කරගත් හෝ ඇසුරු කරගත් නිර්මාණයක් නොවිය යුතුය. එසේම මෙයට පෙර කිසිදු ආකාරයකින් හෝ ප්‍රකාශයට පත් වී නැති නිර්මාණයක් විය යුතුය

## ❖ පද්‍ය රචනා - නිසඳැස්

- ❖ තරග සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
- ❖ එක් තරඟකරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිසඳැසක් පමණි.
- ❖ මූලික වටය සඳහා **"අලුත් ලොවකට පියනගන අපේ ගම"** යන මාතෘකාව යටතේ ඔබගේ නිසඳැස ඉදිරිපත් කල යුතු අතර ඔබ විසින් එවන ලද නිසඳැස අතුරෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අවසන් තරගාවලිය සඳහා ඉදිරිපත් විය යුතුයි.
- ❖ පාසල් තරඟකරුවවන් හා විවෘත අංශයේ සියළු තරඟකරුවන් සඳහා නිසඳැස් පේළි 20 ත් 30 ත් අතර ප්‍රමාණයක් විය යුතුය.
- ❖ සියළු නිර්මාණ ස්වතන්ත්‍ර වියයුතු අතර මොනම ආකාරයකින් හෝ වෙනත් නිර්මාණයකින් උපුටාගත් හෝ අනුවර්තනය කරගත් හෝ ඇසුරු කරගත් නිර්මාණයක් නොවිය යුතුය. එසේම මෙයට පෙර කිසිදු ආකාරයකින් හෝ ප්‍රකාශයට පත් වී නැති නිර්මාණයක් විය යුතුය

<u>ග්‍රාම අභිමන් තරඟාවලිය - 2024</u>

<u>ඒකල තරඟ අයදුම් පත්‍රය</u>

ඇමුණුම 01

01. ග්‍රාම සංවර්ධන සමිතියේ / ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයේ නම :

......................................................................................................................................

02. තරගකරුගේ සම්පූර්ණ නම : ......................................................................................................

03. මුලකුරු සමග නම : ...............................................................................................................

04. උපන් දිනය : ...........................................................................................................................

05. ස්ත්‍රී / පුරුෂ භාවය : ..................................................................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය : .......................................................................................................

07. පෞද්ගලික ලිපිනය : ..................................................................................................................

(ලිපි යොමු කල යුතු) ..................................................................................................................

08. දුරකථන අංකය : .......................................... WhatsApp අංකය ................................................

09. දිස්ත්‍රික්කය : ............................... 10. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ....................................

11. ඉදිරිපත් වන තරග ඉසව්ව : 01. ...................................................................................

02. ...................................................................................

03. ...................................................................................

04. ...................................................................................

05. ...................................................................................

මෙම අයදුම්පතෙහි සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය බවත් උපදෙස් පත්‍රිකාවේ ප්‍රකාර සියළුම කොන්දේසිවලට එකඟ වන බවත්,යම් හෙයකින් තරග අවස්ථාවේදී කොන්දේසි කඩකිරීමක් සිදුවුවහොත් විනිශ්චය මණ්ඩලය ගනු ලබන තීරණ වලට එකඟ වන බවත් සහතික වෙමි.

.........................................

අත්සන

<u>**ග්‍රාම සංවර්ධන නිලධාරිගේ / මැහුම් උපදේශිකාවගේ නිර්දේශය**</u>

උක්ත නම සඳහන් අයදුම්කරු........................................................................................ ග්‍රාම සංවර්ධන සමිතියේ / ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයේ / සාමාජිකයෙකු / පුහුණුලාභියෙකු / සමිති සාමාජිකයෙකුගේ දරුවෙකු /පුහුණුලාභියෙකුගේ දරුවෙකු/ බවත් තරගය සඳහා සියළු සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි

..........................................

ග්‍රාම සංවර්ධන නිලධාරිගේ/ මැහුම් උපදේශිකාවගේ අත්සන

ඇමුණුම 02

<u>ග්‍රාම අභිමන් තරඟාවලිය - 2024</u>

<u>සමූහ තරඟ අයදුම් පත්‍රය</u>

<u>(සමූහ තරග සදහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කල යුතුයි)</u>

01. ග්‍රාම සංවර්ධන සමිතියේ / ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයේ නම :

.............................................................................................................................................

02. ලිපිනය : .............................................................................................................

(ලිපි යොමු කල යුතු) .............................................................................................................

03. දුරකථන අංකය : ......................................... 04. WhatsApp අංකය ................................................

04. දිස්ත්‍රික්කය : .............................................................................................................

07. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..................................................................................................

05. ඉදිරිපත් වන තරග ඉසව්ව : .....................................................................................................

මෙම අයදුම්පතෙහි සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය බවත් උපදෙස් පත්‍රිකාවේ ප්‍රකාර සියළුම කොන්දේසිවලට එකග වන බවත්,යම් හෙයකින් තරග අවස්ථාවේදී කොන්දේසි කඩකිරිමක් සිදුවුවහොත් විනිශ්චය මණ්ඩලය ගනු ලබන තීරණ වලට එකග වන බවත් සහතික වෙමි.

..........................................

අත්සන

<u>**ග්‍රාම සංවර්ධන නිලධාරිගේ / මැහුම් උපදේශිකාවගේ නිර්දේශය**</u>

මෙම අයදුම්පතෙහි සඳහන් ග්‍රාම සංවර්ධන සමිතිය / ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථානය අංක 05 යටතේ දක්වා ඇති තරගය සඳහා ඉදිරිපත් වීමට දක්වා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය බවත්, අමුණා ඇති ලේඛනයේ සඳහන් අයදුම්කරුවන් ග්‍රාම සංවර්ධන සමිතියේ සාමාජිකයන් වන බවත්/ ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුලාභීන් වන බවත්, උපදෙස් පත්‍රිකාවේ ප්‍රකාර සියළුම කොන්දේසිවලට එකග වන බවත්,යම් හෙයකින් තරග අවස්ථාවේදී කොන්දේසි කඩකිරිමක් සිදුවුවහොත් විනිශ්චය මණ්ඩලය ගනු ලබන තීරණ වලට එකග වන බවත් සහතික වෙමි.

...........................................

ග්‍රාම සංවර්ධන නිලධාරිගේ/ මැහුම් උපදේශිකාවගේ අත්සන

- **සමූහ තරඟ සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකතන අංකය හා අත්සන ඇතුලත් ලේඛනයක් මෙම අයදුම්පත්‍රය සමග ඇමුණා එවිය යුතුයි.**